# 14.මිනිසුන් වැඩ කරන තැන්

## ක්‍රියාකාරකම 1

- පහත  දී ඇති පුද්ගලයින් හා ඔවුන් කරන කාර්යන් සොයා යා කරන්න.

| | |
|---|---|
| පළා, එළවළු, පළතුරු විකුණන්නෝ | නිවසේ කුණු, කුණු ලොරියට එකතු කිරීම. |
| ඇඳුම් පිරිසිදු කරන්නෝ | කැඩුණු කුඩය සකසා දීම. |
| වාහන නඩත්තු කරන්නෝ | කැඩීතිබුණු රෙදි සෝදන යන්ත්‍ර සකසා දීම. |
| විදුලි උපකරණ අලුත්වැඩියා කරන්නෝ | වහලයට බර අතු කපා දැමීම. |
| සපත්තු,කුඩ, බෑග් මසන්නෝ | රෙදි සෝදා මැද දීම |
| කුණු ගෙන යන්නෝ | වාහන අලුත් වැඩියා කර දීම |
| පොල් කඩන්නෝ | පිහිය මුවහත් කර දීම. |
| ගස් වල අතු කපන්නෝ | එළවළු,පළතුරු,පළා,නිවසට ගෙනවිත් දීම |
| කතුරු පිහි මුවහත් කරන්නෝ | ගස් නැඟ පොල් කඩා දීම |
| ලියුම් බෙදන්නෝ | විදුලි හා ජල බිල් ලබා දීම |
| මනු කියවන්නෝ | නිවස හා අවට පිරිසිදු කර දීම |
| පිරිසිදු කිරිම් කරන්නෝ | නිවසට ලියුම් ගෙනවිත් දීම |

- පහත දී ඇති පුද්ගලයින් එම කාර්යය කිරිමේදී  උපයෝගි කර ගන්නා ආයුධ හා උපකරණ ලියා අඳින්න.

01. වාහන නඩත්තු කරන්නෝ

02. සපත්තු,කුඩ, බෑග් මසන්නෝ

03. පොල් කඩන්නෝ

04. විදුලි උපකරණ අලුත්වැඩියා කරන්නෝ

05. පිරිසිදු කිරීම් කරන්නෝ

06. කතුරු පිහි මුවහත් කරන්නෝ

## ක්‍රියාකාරකම 2

- ඔබේ නිවසට ආසන්නව පිහිටි ඔබ දැක ඇති සේවා ස්ථානයක් නම් කරන්න. උදා:- ගඩොල් කපන වැඩ බිමක්
  වාහන අලුත් වැඩියා කරන තැනක්
  ගොවි බිමක්
- එම සේවා ස්ථානයේ දර්ශනයක් ඔබේ මතකයේ හැටියට හෝ වැඩිහිටියෙකුගෙන් අසා ගත් ආකාරයට චිත්‍රයට නඟන්න.
- හැකිනම් වැඩිහිටියෙකු සමඟ එම ස්ථානය නැරඹීමට යන්න.
- ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න.

01. එම ස්ථානයේ නිෂ්පාදනය කළේ මොනවාද?.....................................
02. සේවකයන් ඇඳ සිටි ඇඳුම් පැළඳුම් මොනවාද?....................................
03. වැඩ කරන්නේ කවුරුන්ද?.................................................................
04. භාවිත කළ භාණ්ඩ හා උපකරණ මොනවාද ?.....................................
05. ආරක්ෂාව සලසා ගැනීමට යොදා ගෙන ඇති දෑ මොනවාද? ................
.............................................................................................................

# ක්‍රියාකාරකම 3

- පහත සඳහන් ගී වලට සවන් දෙන්නට අවස්ථාව ලබා දෙන්න.

මා දැල් ඇදීම

01. ඕඩි හෙලෙයි හෙලෙයියා
අදිමුකො දැල හෝයියා

02. තෝරු බලයෝ අංජිලාවෝ
මෝරු පරව් කුම්බලාවෝ
මේවා මුදු මාළු
අදිමුකො දැල යාළු

03. පොකිරිස්සෝද හාල් මැස්සෝ
කූනිස්සෝද පියාමැස්සෝ
මේවා මුදු මාළු
අදිමුකො දැල යාළු

04. කෙළවල්ලෝ කාරල්ලෝ
අංගුලුවෝ සහ දැල්ලෝ
මේවා මුදු මාළු
අදිමුකො දැල යාළු
ඕඩි හෙලෙයි හෙලෙයියා
අදිමුකො දැල හෝයියා
( ගී සීපද ) එච්.ඩී.ජයතිලක

වැඩ කරමු

1. ටාං ටීං කම්හලේ
යකඩ තලනවා
තලන යකඩ දමාලා
උදලු හදනවා

2. ගල්වලේ ගල් කඩා
පාර හදනවා
පාරෙ තාර දමාලා
ට්‍රැක්ටර් යනවා

3. වැව් කපා ඇළ හදා
වතුර එවනවා
කුඹුරේ වතුර පිරීලා
ගොයම් හැදෙනවා

4. සේරම අපි එක් වෙලා
වැඩෙහි යෙදෙනවා
ඒ හින්දා අපේ රටට
කිරි ඉතිරෙනවා
( ගී සීපද ) එච්.ඩී.ජයතිලක

❖ දරුවා සමග මෙවන් ගීත ගයමින් රස විඳින්න.

# ක්‍රියාකාරකම 4

- මිනිසුන් වැඩ කිරිමේදී තම ආරක්ෂාව හා පරිස්සම වෙනුවෙන් යොදා ගන්නා පහත දැක්වෙන දේවල් කොටුව තුළ අඳින්න.

01.හිස් වැසුම් හා යකඩ තොප්පි

02. අත්දිග කමිස හා දිග කලිසම්

03. සෙරෙප්පු, සපත්තු සහ ආවරණ සපත්තු (බූට්)

04. අව් කණ්ණාඩි

05. මුඛ ආවරණ

# ක්‍රියාකාරකම 5

- ඔබ විසින් නම් කරන ලද වැඩ බිමෙහි  භාවිත කරනු ලබන ඇඳුම් පැළඳුම්වල හා උපකරණ වල ආකෘති නිර්මාණය කරන්න.

  උදා:-   ඉනිමඟක්
  හිස්වැසුමක්
  මුඛ ආවරණයක්
  උදැල්ලක්